වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT 2022

ඉඩම් මැනුම් සභාව
நில அளவைச் சபை
Land Survey Council

ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05.
Epy msitr; rig> epy msitahsH mjpgjp mYtyfk;>,y.150 ngர்னாட்nfhOk;G 05.
Land Survey Council, Surveyor General's Office, No. 150, Colombo 05.

පටුන

1.	සභාපතිතුමාගේ පණිවුඩය	02
2.	දැක්ම සහ මෙහෙවර	03
3.	ඉඩම් මැනුම් සභාව	04
4.	ඉඩම් මැනුම් සභාවේ කාර්යයන්	04
5.	ඉඩම් මැනුම් සභාව සතු බලතල	05
6.	ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තාව	06
7.	ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය	07
8.	ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්	08
9.	අධ්‍යයන හා පුහුණු වැඩ කටයුතු	12
10.	මූල්‍ය කළමනාකරණය	14
11.	2022 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශනය	16
	I. මූල්‍ය තත්ව ප්‍රකාශනය	
	II. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය	
	III. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	
	IV. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	
	V. 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන	
	VI. 2022 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති	
12	විගණකාධිපති වාර්තාව 2022	26

01. සභාපතිතුමාගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
අංක150,
කොළඹ 05.
20-03-2023

විශේෂයෙන්ම 2022 වසර මුළුල්ලෙහිම රටතුල වරින් වර ඇතිවූ විවිධ අර්බුදකාරී අභියෝග හමුවේ ගුණාත්මක හා කාර්යක්ෂම ලෙස වෘත්තියෙන් උසස් තත්වයෙන් යුත් මැනුම් සේවාවක් සැපයීම වස් මැනුම් වෘත්තියවේදීන් ශක්තිමත් කිරීම තුලින් මහජනතාවගේ විවිධවූ මැනුම් අවශ්‍යතාවයන් ඵලදායී ලෙස සපුරාලීම සඳහා සුවිසල් දායකත්වයක් ලබා දීමට ඉඩම් මැනුම් සභාවට හැකියාවක් ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටු වෙමි.

2002 අංක 17 දරණ මැනුම් පනත තුළින් ඉඩම් මැනුම් සභාවට පැවරී ඇති කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන වශයෙන් මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, වෘත්තීයමය මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීයමය විනය පාලනය මැනුම් සභාවේ වගකීම් වේ. එපමණක් නොව ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනයා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීමත්, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ තොරතුරු මහජනයා වෙත ලබා දීමත්, වෙනත් වෘත්තීයමය ආයතන සමග සමායෝජනය කිරීමත් ඉඩම් මැනුම් සභාවේ වගකීම් වලට අයත් ය.

ඉඩම් මැනුම් සභාව පිහිටුවා මේවන විට දශක දෙකකට ආසන්න කාලයක් ගතවී තිබුනද මෙතෙක් එහි විශාල අඩුපාඩුවක්ව පැවති මැනුම් විද්‍යා උපාධිධාරීන් වෙත ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් නොතිබීම සම්බන්ධයෙන් සභාවේ සියළු සාමාජිකයින්ගේ එකඟතාවයෙන් ශක්තිමත් රෙගුලාසි මාලාවක් කෙටුම්පත් කර සම්මත කර ගැනීමට හැකිවීම මෙම වසර තුල ලද විශාල ජයග්‍රහනයක් බව නිහතමානීව සඳහන් කරමි. ශාස්ත්‍රීය සුදුසුකම් ලත් මැනුම් විද්‍යා උපාධිධාරීන් සඳහා ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා ගැනීමට නිසි මාර්ගෝපදේශයක් හා නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කිරීම මෙම රෙගුලාසිවල මූලික අපේක්ෂාව විය. මේවන විට නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර තිබෙන මෙම රෙගුලාසි, ඉදිරිපත්වන කරුණු අනුව අදාළ සංශෝධනය/වැඩි දියුණු කර ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ඇත

තවද ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය මෙන්ම වෘත්තීමය විනය පවත්වා ගැනීම උදෙසා 2022 වසරේදී ද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන පුහුණු පාඨමාලා කිහිපයක් ම අනුමත කොට පැවැත්වීමට ඉඩම් මැනුම් සභාව විශේෂයෙන් කටයුතු කර ඇත. එහි දී පාඨමාලාවලට සහභාගී වීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් විසින් දක්වන ලද උනන්දුව කැපී පෙනුනි.

සමාලෝචිත කාල සීමාව තුල ඉඩම් මැනුම් සභාව හොඳින් පවත්වා ගෙන යාම සඳහා වැඩ බලන ලේකම්, ගණකාධිකාරී (අර්ධ කාලීන) ඇතුළු සමස්ත කාර්යය මණ්ඩල මෙන්ම ඉඩම් මැනුම් සභාවේ සියළු සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය සහ කැපවීම පිළිබඳ මාගේ ස්තුතිය පුද කරමි.

එස්. සිවානන්දරාජා
සභාපති

02. දැක්ම සහ මෙහෙවර

දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛන්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත් වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරු කර ඒ තුළින් තරඟකාරී ගෝලීය වෙළඳපොළ තුල ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුනත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාඟිගත වී වෘත්තියමය පරිසරය ශක්තිමත් කිරීම අපගේ මැනුම් සභාවේ දැක්ම වේ.

මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත් වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ නාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තීයට ප්‍රවේශ වන්නන් වෙත ලැබෙන බවටත් එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරීම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

03. ඉඩම් මැනුම් සභාව

2002 අංක 17 දරන මැනුම් පනතෙහි 26 වැනි වගන්තියේ සඳහන් විධි විධාන අනුව කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල තුල 2003 වර්ෂයෙහි මාර්තු මාසයේදී ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලදි.
මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සංයුතිය කෙසේ විය යුතුද යන්න පිළිබඳව විධි විධාන සලස්වා ඇත. එකී විධි විධාන වලට අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර එම සාමාජිකයින් පත් වන ආකාරය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයින්

i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා

ii. උප සභපති - සර්වේයර් ජනරාල් විසින් නම කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධුරයක් දරණ ලියාපදිංචි මිනින්දෝරු වරයෙකු

iii. සාමාජික - 1969 අංක 21 මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ) පත්වන සාමාජිකයින්

i. සාමාජික - 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරණ මිනින්දෝරුවරුන් තිදෙනෙක්

ii. සාමාජික - 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතින් පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයකින් නම් කරණු ලබන අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂෙත්‍රයන් හි එක් විද්වතෙකු

මෙම පත්කිරීම් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ

04. ඉඩම් මැනුම් සභාවේ කාර්යයන්

ඉහත පනතේ 37 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් පහත පරිදි වේ.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්යය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.

(ඇ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරීම.

(ඇ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධන කිරීම.

(ඊ) ඉඩම් මැනිම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තීමය සුදුසුකම් පිළිගැනිම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තිමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදී සම තත්වයක් සහ අන්‍යොන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යොන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තිමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම

05. ඉඩම් මැනුම් සභාව සතු බලතල

05.1 මැනුම් පනතේ 38 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාව සතු බලතල පහත පරිදි වේ.

(අ) යම් වංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(ආ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීමට සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම.

(ඇ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

(ඈ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

(ඉ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

(ඊ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

(උ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සහ

(ඌ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

05.2 මැනුම් පනතේ 47 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාව සතු විනය බලතල පහත පරිදි වේ.

(1) මේ කොටසට අනුකූලව පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු වෘත්තීය විෂමාචාරයට වරදකරු වී ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවකදී සභාව විසින් පහත සඳහන් නියමයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් කරනු ලැබිය හැකිය :-

(අ) ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය අවලංගු කොට ඒ මිනින්දෝරුවරයාගේ නම, නාම ලේඛනයෙන් ඉවත් කරන ලෙස වූ නියමයක් කිරීම :

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා අත්හිටුවන ලෙස වූ නියමයක් කිරීම :

(ඇ) ලියාපදිංචි මිනින්දෝරුවරයකුට නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් අත්හිටුවන ලෙසට වූ නියමයක් කිරීම :

(ඉ) සභාව විසින් පනවනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා ඉඩම් මැනීමේ වෘත්තියේ යෙදීමට ලියාපදිංචි මිනින්දෝරුවරයාට හැකි බවට වූ නියමයක් කිරීම :

(ඊ) ගාස්තු පිළිබඳව හෝ සභාව විසින් උචිත යයි සලකනු ලබන අන්‍යාකාර වූ, වෙනත් යම් උචිත නියමයක් කිරීම.

(2) මේ වගන්තිය යටතේ වූ ලියාපදිංචිය අත්හිටුවීමේ නියමයක් බලාත්මකව පවතින විට ඒ තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා ලියාපදිංචි නොවූ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය. නමුත් ඒ නියමය අවසන් වූ වහාම එසේ අවසන්වීමේ දින සිට ලියාපදිංචි මිනින්දෝරුවරයකු ලෙස ඔහුගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද නැවත ලබාදිය යුතුය.

(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු සියලු ගාස්තු සහ වියදම් සභාවට අයවිය යුතු ණයක් වශයෙන් සභාව විසින් අයකරගනු ලැබිය යුතු ය.

06. 2022 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තා

06.1 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල සීමාව තුල සභාවේ සංයුතිය සහ එම සාමාජිකයින්ගේ පත්වීම් දින පහත පරිදි වේ

I.	සභාපති / ඒ. දිසානායක මහතා	- 2021.11.18 සිට
II.	උප සභාපති / ආර්. පලිහක්කාර මහතා	- 2021.11.18 සිට
III.	සාමාජික / කේ.කේ.එස්. රත්නායක මහතා	- 2021.10.14 සිට
IV.	සාමාජික / මහාචාර්ය කේ.එම්.සී. කොන්තසිංහ මහතා	- 2021.06.01 සිට
V.	සාමාජික / එන්. ඒ. ගුණවර්ධන මහතා	- 2021.01.01 සිට
VI.	සාමාජික / කේ.ඒ.කේ.එල්. එදිරිසිංහ මහතා	- 2021.01.01 සිට
VII.	සාමාජික / ජේ.එම්. විජේවර්ධන මහතා	- 2021.01.01 සිට

<u>සටහන:</u> මැනුම් පනත ප්‍රකාරව සභාවේ ඉහත සංයුතියට අමතරව මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් නියෝජිතයෙකු සභාවේ මාසික පාලක මණ්ඩල රැස්වීම් පාලක මණ්ඩල රැස්වීම් සඳහා සඳහා සහභාගි වේ. 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා වූ සමාලෝචිත කාල සීමාව සඳහා, මුදල් අමාත්‍යාංශ නියෝජිත ලෙස එච්.එම්. සාලිය ධර්මවර්ධන මහතා සභාවේ පාලක මණ්ඩල රැස්වීම් වලට සහභාගි වී ඇත.

06.2 2022.01.01 දින සිට 2022.12.31 දක්වා වූ සමාලෝචිත කාල සීමාව තුල මාසික සභා රැස්වීම් 09 ක්, මහජන පැමිණිලි විමර්ශනය සඳහා රැස්වීම් 07 ක් හා උප කමිටු රැස්වීම් 07 ක් පවත්වා ඇත.

එම රැස්වීම් සඳහා එක් එක් සමාජිකයින්ගේ සහභාගිවීම් පහත පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	මාසික රැස්වීම්	විමර්ශණ රැස්වීම්	උප කමිටු රැස්වීම්
1	ඒ.දිසානායක	සභාපති	9	6	1
2	ආර්.පලිහක්කාර	උප සභාපති	8	3	5
3	කේ.කේ.එස්.රත්නායක	සමාජික	9	7	4
4	මහාචාර්ය / කේ.එම්.සී.කොන්තසිංහ	සමාජික	7	-	-
5	කේ.ඒ.කේ.එල්.එදිරිසිංහ	සමාජික	7	7	6
6	ජේ.එම්.විජේවර්ධන	සමාජික	8	7	6
7	එන්.ඒ.ගුණවර්ධන	සමාජික	7	7	7
8	එච්.එම්.එස්.ධර්මවර්ධන	මුදල් අමාත්‍යාංශ නියෝජිත	9	-	1

07. ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව 2022.01.01 දින සිට 2022.12.31 දක්වා වූ සමාලෝචිත කාල සීමාව සඳහා මැනුම් සභාවේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	පත්වීම් දිනය
1	එම්.එන්.අමරසිරි මයා	ලේකම් / වැඩ බලන	2021.12.01
2	කේ.එල්.ඒ.එන්.සඳමාලි මිය	ගණකාධිකාරී / අර්ධ කාලීන	2021.10.05
3	ඩබ්ලිව්.ඒ.එස්.ප්‍රියදර්ශනි මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු	2004.05.24
4	එච්. කේ. කුලතුංග මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2022.07.11
5	එම්.ඩී.එච්. හංසනී මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2022.09.01
6	ඒ.එච්. දහනායක මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2022.10.25
7	ටී.ජී.ප්‍රනාන්දු මයා	කාර්යාල කාර්යය සහයක	2004.07.15

08. ක්‍රියාකාරකම්

08.1. ලියාපදිංචි කිරීම


2022.01.01 දින සිට 2022.12.31 දක්වා වූ සමාලෝචිත කාල සීමාව සඳහා, මැනුම් පනතෙහි 39 වැනි වගන්තිය සමඟ කියවිය යුතු උපලේඛනය අනුව ශාස්ත්‍රීය සුදුසුකම් හා නියමිත ප්‍රායෝගික පළපුරුද්ද සපුරන ලද අයදුම්කරුවන් 106 දෙනෙකු (2021 වර්ෂයෙන් ඉදිරියට ගෙනෙන ලද අයදුම්පත්‍ර 21 ක් ද සමඟ) ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත්‍ර යොමු කරන ලදි.

එලෙස ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද, හැකියාව, නිපුණතාවය හා ශාරීරික යෝග්‍යයතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉන් අයදුම්කරුවන් 72 දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දෙන ලදි. 2021 වර්ෂය තුලදී ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දෙන ලද සංඛ්‍යාව 34 කි. මෙය එම වර්ෂය හා සැළකීමෙදී දෙගුණයක පමණ වැඩිවීමකි.

එසේම ශාස්ත්‍රීය සුදුසුකම්, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද හා හෝ නියමිත පරිදි අයදුම්පත්‍ර යොමු නොකිරීම හේතුවෙන් ඉල්ලුම්පත්‍ර 23 ක් ප්‍රතික්ෂේප කරන ලදි. එසේම තවත් අයදුම්පත්‍ර 11 ක් 2023 වර්ෂය තුල සළකා බැලීම සඳහා යොමු කර ඇත.

ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා ගන්නා ලද සමස්ථ මිනින්දෝරු සංඛ්‍යාව 2442 කි.


2021 සහ 2022 වසර තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් ශාස්ත්‍රීය සුදුසුකම් හා, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද සපුරන ලද අයදුම්කරුවන් වෙත ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දීම පිළිබඳ සංඛ්‍යාමය තොරතුරුවල ප්‍රස්තාරික නිරූපනය පහත දක්වා ඇත.



08.2 වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර

සමාලෝචිත වර්ෂය සඳහා මැනුම් වෘත්තියේ යෙදීමේ වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවීම 2021 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී අරඹන ලදී. ඒ අනුව 2022 වර්ෂය වෙනුවෙන් වාර්ෂික මැනුම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර 924 ක් ලැබී තිබූ අතර විවිධ අඩුපාඩු හේතුවෙන් ඉන් අයදුම්පත්‍ර 13 ක් ක් ප්‍රතික්ෂේප කරන ලදි. ඒ අනුව 2022 වර්ෂය සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර 911 ක් නිකුත් කර ඇත.

ඉඩම් මැනුම් සභාව විසින් 2021 වර්ෂය සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර 1,331 ක් නිකුත් කරන ලද අතර එය මෙම වසර හා සැලකීමෙහිදී බලපත්‍ර 420 ක තරම් විශාල අඩුවීමකි. 2021 වසරට සාපේක්ෂව මෙම අඩුවීම ප්‍රතිශතයක් ලෙස 31.5% ක් වේ.
මෙයට ප්‍රධාන හේතුව වූයේ 2021 වර්ෂය සඳහා පෞද්ගලිකව මැනුම් වෘත්තියෙහි යෙදීමට රජයේ මිනින්දෝරුවරුන්ට ලබා දී තිබුන අවසරය අධිකරණමය නියෝගයක් හෙතුවෙන් තාවකාලිකව අත්හිටුවීමට සිදු වීම වේ.
2021 සහ 2022 වර්ෂයන් තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරුන් වෙත නිකුත් කරන ලද වාර්ෂික මැනුම් බලපත්‍ර පිළිබඳ සංඛ්‍යාමය තොරතුරුවල ප්‍රස්තාරික නිරූපනය පහත දක්වා ඇත.



2022 ජනවාරි 1 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර 2022 අප්‍රේල් මස 01 දින අංක 2,274 හා 2022 නොවැම්බර් මස 04 වන දින අංක 3,305 දරන ගැසට් පත්‍රයන්හි පළකර ප්‍රසිද්ධියට පත් කර ඇත.

මීට අමතරව වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ ලියාපදිංචි අංකය, මුලකුරු සමඟ නම, සම්පූර්ණ නම, ජාතික හැඳුණුම්පත් අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය හා බලපත්‍රය වලංගු කාලසීමාව ආදි විස්තර www.survey.gov.lk වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. තව ද මෙම විස්තර ත්‍රෛමාසිකව යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ඇත.

08.3 මහජනතාව වෙත තොරතුරු ලබා දීම.

ඉඩම් මැනුම් සභාව විසින් ලබාදෙන සේවාවන් පිළිබඳ මහජනතාව දැනුවත් වී ඇති නිසා වසර සිය ගණනක් පැරණි පිඹුරු සම්බන්ධව වුවද ඒවාට සම්බන්ධ වාර්ෂික මැනුම් බලපත්‍ර ලාභී මිනින්දෝරුවරුන්ගේ ජීව විස්තර තොරතුරු ලබා ගැනීම සඳහා නිබඳව ම ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් බොහෝ ය. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දීම සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර ලාභී සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණක ගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා

ගෙන යාමට කටයුතු කර ඇත. හැකිතාක් දුරට මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංකද ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරු වල පිටපත් ලබා ගැනීමට දුරකථන මගින් ඔවුන් සම්බන්ධ කර ගැනීමේ පහසුකම මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද මේ දක්වා අප විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙළ කළ පැරණි පිඹුරු වල පිටපත් ලබා ගැනීමේ දී ලත් පිටුවහල ක්‍රමානුකූල නොවීම පිළිබඳ ව මැනුම් සභාව කෘප්තිමත් නොවේ. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙල කරනු ලබන පිඹුරු වල පිටපත් ලබා ගැනීම හා හෝ ඊට අදාල වෙනත් තොරතුරු ලබා ගැනීමේ පවතින දුෂ්කරතාව මහජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස මෙය හඳුනා ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් සැලසුම් කිරීමට සභාවේ අවධානය මේ වන විට යොමු වී ඇත.
කෙසේ වුවද සමාලෝචිත කාල සීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 94 ක දී මෙම තොරතුරු ලබා දී ඇත.

08.4 ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි


ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරනු ලබන මැනුම් කටයුතු හා පිළියෙල කරනු ලබන පිඹුරු වලට සම්බන්ධව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීම ඉඩම් මැනුම් සභාව සතු තවත් එක් ප්‍රධාන කර්තව්‍යයකි. හුදෙක්, මෙම පැමිණිලි විභාග කෙරෙනුයේ මැනුම් පනතේ 46 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන වලට යටත්ව වේ. පැමිණිලි විභාග කිරීම සඳහා සෑම මසකට වරක් හෝ දෙවරක් (ලැබී තිබෙන පැමිණිළි ප්‍රමාණය අනුව) ඉඩම් මැනුම් සභාව රැස්වෙන අතර එක් විමර්ශන වාරයකදී පැමිණිලි 6 ක් හෝ 7 ක් පමණ විභාග කිරීමට කටයුතු කරයි. මෙමගින්, මහජනතාවට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරනු ලබන ඉඩම් මැනුම් හා හෝ ඔවුන් විසින් පිළියෙල කරනු ලබන පිඹුරු සම්බන්ධයෙන් පවතින ගැටළු බොහෝ දුරට නිරාකරණය කර ගැනීමට හැකි වන අතරම මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විනය හා වෘත්තීය සදාචාරය වැඩි දියුණු කර ගැනීමට අවස්ථාවක්ද මින් සැලසෙනු ඇත.
කෙසේ වුවද, සමහර පැමිණිලිවල ස්වභාවය අනුව එනම්, අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම් සහ ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකළ නොහැකි ගණයේ පැමිණිලි සම්බන්ධව ඉඩම් මැනුම් සභාව තීරණ ලබා නොදෙන අතර, එවැනි අවස්ථාවලදී අදාල පැමිණිලිකරුවන්ට එම ගැටළු අධිකරණ ක්‍රියා මාර්ගයෙන් විසඳා ගැනීමට හෝ අවස්ථානුකූලව වෙනත් සුදුසු ප්‍රතිකර්ම ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් දෙනු ලැබේ.

2022 වර්ෂයට පෙර වර්ෂයන්හි ලැබී එහෙත් එම වර්ෂයන්හි විභාග කර අවසන් කිරීමට නොහැකි වූ පැමිණිලි හා සමාලෝචිත වර්ෂය තුල ලැබුණු හා එකී වර්ෂය තුල විභාග කර අවසන් කරන ලද පැමිණිලි පිළිබඳ සංඛ්‍යා තොරතුරු පහත දැක්වේ.

2021 දෙසැම්බර් මස 31 දිනට විභාග අවසන් නොවී ඉතිරිව තිබූ සංඛ්‍යාව	= 104
2022 වසර තුළදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව	= 72
2022 වසර තුළදී අඩුපාඩු හේතුවෙන් ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි සංඛ්‍යාව	= 01
2022 වසර තුළදී විභාග කර අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව	= 41
2022 දෙසම්බර් 31 දිනට විභාග අවසන් නොවී ඉතිරි වූ සංඛ්‍යාව	= 134

2021 වසර තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව 63 වූ අතර එයට සාපේක්ෂව 2022 වසර තුළ පැමිණිලි ලැබීමේ ප්‍රතිශතය 14% කින් වැඩිවී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලි විභාග අවසන් කිරීම 2021 වසරේදී 39 ක් වූ අතර එයට සාපේක්ෂව 2022 වසරේ පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිශතය 5% පමණ සුළු වැඩිවීමක් නිරීක්ෂණය වේ.

මෙම දත්ත පහත දැක්වෙන 2 වන රූපය මගින් ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.



08.5 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය හා වෙනත් විෂමාචාර සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග

මැනුම් කටයුතු කිරීමේදී විෂමාචාර ක්‍රියාවන් කර ඇති බවට සභාව නිගමනය කර ඇති විටෙක එවැනි මිනින්දෝරුවරුන්ට එරෙහිව 2002 අංක 17 දරණ මැනුම් පනතේ 47 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව සිදු කරනු ලබන විමර්ශනයකින් අනතුරුව දඩුවම් පැණවිය හැක.

2022 වසරේදී ඉඩම් මැනුම් සභාව විසින් ඉහත 08.4 වැනි ඡේදයෙහි විස්තර කර ඇති පරිදි, ලැබෙන පැමිණිලි විභාග පවත්වනු ලැබීමෙන් පසුව ගන්නා ලද තීරණ අනුව චූදිත මිනින්දෝරුවරුන් හට පරීක්ෂණ ගාස්තු අයකිරීම් සහ අවවාද කිරීම් අවස්ථා ගණනාවකදීම සිදු කර ඇත.

තවද සමාලෝචිත කාලය තුල එනම් 2022 වර්ෂය තුල එක් අවස්ථාවකදී පමණක් එක් චූදිත ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු හට පහත සඳහන් පරිදි බලපත්‍ර අත්හිටුවීම් හා ලියාපදිංචිය අවලංගු කිරීම යන දඩුවම් දෙකම පැණවීමට කටයුතු කර ඇත.

පැමිණිලි අංකය	ලියාපදිංචි අංකය	මිනින්දෝරුවරයාගේ නම	පරීක්ෂණයේ තීරණය
ඉමැස/5/1217	19891607	කන්දයියා කමලනාදන්	2023 වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍රය අත්හිටුවීම හා රු. 10,000.00 ක පරීක්ෂණ ගාස්තුවකට යටත් කිරීම
ඉමැස/5/1158 ඉමැස/5/1159 ඉමැස/5/1160	19891607	කන්දයියා කමලනාදන්	2023.01.01 සිට 2025.12.31 දක්වා වසර 3 ක කාලයකට ලියාපදිංචිය අත්හිටුවීම

09. අධ්‍යාපන හා පුහුණු වැඩ කටයුතු

09.1 ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් මැනුම් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් ඔවුන් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස මැනුම් වෘත්තියට පිවිසෙන මුල්ම අවස්ථාවේදී ඒ සඳහා දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීම ද ඉඩම් මැනුම් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එම පාඨමාලාවල දී සම්පත් දායකත්වය සඳහා පුළුල් ශ්‍රාස්ත්‍රීය දැනුමක් සහ විශේෂයෙන් මැනුම් ක්ෂේත්‍රයේ මනා පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් මෙම නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය ඥානය අවබෝධය, සහ මහපෙන්වීම ලබා දෙනු ඇත.
මැනුම් වෘත්තිකයෙකු ලෙස ප්‍රථම වරට එම වෘත්තියට පිවිසීමේ දී, කිසිදු අපහසුතාවයකින් හෝ ගැටළුකාරී තත්වයකින් තොරව ආරම්භයේ සිටම මහජනයාට උසස් හා ගුණාත්මක සේවාවක් ලබා දීමට ලියාපදිංචි මිනින්දෝරුවරයා යොමු කිරීම මෙම දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීමෙහි ප්‍රධානතම අරමුණවේ.
කෙසේවුවද 2022 වර්ෂයේදී රට තුල ආර්ථික ඇතුළු වෙනත් අර්බුදකාරී තත්වය හමුවේ ප්‍රථමවරට වාර්ෂික මැනුම් බලපත්‍රය ලබා ගන්නා ලද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට සමාලෝචිත වර්ෂය සඳහා දිශානුගත කිරීමේ පාඨමාලාවක් පැවැත්වීමට නොහැකි විය.

09.2 අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CDP) පාඨමාලා

විශේෂයෙන් බිම්මැනීම හා සම්බන්ධ විෂය ගත්කල, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් අත්‍යවශ්‍ය අංගයක් වේ. වර්තමාන සාමාජීය, ආර්ථික මෙන්ම නෛතිකමය වශයෙන් මෙන්ම සහ තාක්ෂනික වශයෙන් සිදුවන වෙනස්කම් වලට අනුරූපි ලෙස උසස් හා ගුණාත්මක පිඹුරු හා සිතියම් නිෂ්පාදනය සඳහා මැනුම් වෘත්තිකයින්ට මෙවැනි වැඩ සටහන් වලින් ලැබෙන දැනුම හා මාර්ගෝපදේශයන් ඉතාමත් මහෝපකාරීවේ.
මැනුම් වෘත්තියේ යෙදී සිටින සහ මැනුම් සභාවේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයන්ගේ දැනුම සහ දක්ෂතා වැඩි දියුණු කරලීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉඩම් මැනුම් සභාව සතු කාර්යක් බවට මැනුම් පනතේ 37 වැනි වගන්තිය යටතේ සඳහන්ව ඇත. එබැවින් සියලුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළු වලට සහභාගි කරවීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් නිරතුරුවම සිදු කරනු ලබයි.

මෙහිදී, පුද්ගලික මැනුම් වෘත්තියෙහි නියැලීමට අපේක්ෂා කරන ආධුනික මැනුම් වෘත්තිකයින් (ප්‍රථම වරට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබා ගන්නා මිනින්දෝරුවරුන් සඳහා) දිශානුගත කිරීමේ වැඩසටහන් මෙන්ම පළපුරුදු මිනින්දෝරුවරුන් සඳහා දියුණු තාක්ෂණික ක්‍රම වලට අදාල වැඩසටහන් ද වෙන් වශයෙන් පවත්වනු ලැබේ. තවද, ඉඩම් මැනුම් සභාවට අමතරව, එහි නියාමනය හා අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගම් වැනි පිළිගත් ආයතන මගින්ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

විශේෂයෙන්ම භාහිර ආයතන හා හෝ සංවිධාන විසින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමෙදී, ඒ සඳහා සහභාගි කර ගන්නා සම්පත් දායකයිනගේ ශ්‍රාස්ත්‍රීය හා විශේෂඥ දැනුම මෙන්ම ඔවුන් නියෝජනය කරන ක්ෂේත්‍රයන්හි දක්වා තිබෙන නිපුණතාව කෙරෙහි ඉඩම් මැනුම් සභාව විශේෂ අවධානයකින් කටයුතු කරනු ලබයි.

එසේම සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවට අමතරව ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ ගම්පහ, කුරුණෑගල හා යාපනය යන දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තිය සංවර්ධන

පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් දක්වා ඇති උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත්වන අතර එම පාඨමාලා ඉඩම් මැනුම් සභාව විසින් පිළිගැනීමට ලක්කර ඇත.

2022 වසරේදී පවත්වා ඇති අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ


	ආයතනය	වෘත්තීය සංවර්ධන පාඨමාලාව	පැවැත්වූ දිනය
1	ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය	කඩඉම් සිතියම්වල පසු කාලීන මැනුම් හා ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධති	2022.01.29
2	කුරුණෑගල දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය	වෘත්තීය ආචාරධර්ම	2022.02.25
3	යාපනය දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය	පරිපාලනය සඳහා නවීන මැනුම් තාක්ෂණය භාවිතය	2022.08.20
4	ඉඩම් මැනුම් සභාව	සභාධිපත්‍ය මූලධර්ම හා සභාධිපත්‍ය පිඹුරු	2022.08.24
5	ඉඩම් මැනුම් සභාව	සභාධිපත්‍ය මූලධර්ම හා සභාධිපත්‍ය පිඹුරු	2022.09.15
6	ඉඩම් මැනුම් සභාව	GNSS තාක්ෂණය හා CORS Network	2022.10.14
7	ඉඩම් මැනුම් සභාව	GNSS තාක්ෂණය හා CORS Network	2022.12.02
8	ඉඩම් මැනුම් සභාව	වෘත්තීය ආචාරධර්ම	2022.12.08
9	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	ඉඩම් කළමනාකරණය හා මැනුම් පනත	2022.12.13

10. මූල්‍ය කළමනාකරණය

10.1 ආදායම සහ වියදම

2021 වර්ෂයේ දී ඉඩම මැනුම් සභාව ඉපැයූ ආදායම රු. 6,498,077.00 ක් වන අතර 2022 වර්ෂයේ ආදායම රු.7,560,385 කි. ඒ අනුව 2021 වර්ෂය හා සැසඳීමෙහිදී මෙම වර්ෂය තුල දී සභාව ඉපැයූ ආදායම පෙර වර්ෂයට වඩා රු.1,062,308.00 කින් වැඩි වී ඇත.
2022 වර්ෂය සඳහා සභාව දරන ලද වියදම් රු. 7,111,198.00 වන අතර 2021 වර්ෂයෙහි සභාවේ වියදම් රු. 5,539,162.00 කි.
ඒ අනුව 2022 වසර තුළදී සභාව රු. 449,187.00 ක ශුද්ධ ලාභයක් ලබා ඇත.

2022 සහ 2021 වර්ෂයන්හි සභාවේ ආදායමෙහි හා වියදමෙහි ප්‍රස්ථාරික නිරූපණය පහත දැක්වේ.



10.2 සභාවේ අරමුදල්

මැනුම් පනතේ 56 (2) වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ අරමුදල් රැස් කළ යුතු ආකාරය විස්තර කර ඇත. ඒ අනුව, ඒකාබද්ධ අරමුදලින් ලැබිය හැකි මුදල් ද, මැනුම් පනත යටතේ සභාවට දී ඇති බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් සහ ඉටු කිරීමෙන් සභාවට ලැබෙන මුදල් ද, සභාවට බැර කළ යුතු වේ. එයට අමතරව ත්‍යාග, ප්‍රධාන සහ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවේ අරමුදලට එකතු වේ. සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීමේදී වැය වන මුදල් මැනුම් පනතේ 56(3) වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව මෙම අරමුදලින් ගෙවිය යුතු වේ.

2022 වසර සඳහාද පෙර වර්ෂයන්හි මෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් කිසිදු ප්‍රතිපාදන මුදලක් සභාව වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී නැත. එබැවින් මැනුම් සභාවේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී ඊට අදාළ සියලු ආයතනික සහ පරිපාලන වියදම් දරන ලද්දේ එමගින් රැස් කර ගන්නා අරමුදල් මගිනි. එලෙස එක් රැස් කර ගන්නා සියලු මුදල් මැනුම් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.
මැනුම් සභාවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වන්නේ මිනින්දෝරු වෘත්තිකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම වේ. එයට අමතරව, ශ්‍රාස්තීය සුදුසුකම් ලත් අය සඳහා සභාවේ ලියාපදිංචිය ලබා දීම, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීමෙන්, මහජනතාවට තොරතුරු නිකුත් කිරීමෙන්, මහජන

දීම, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීමෙන්, මහජනතාවට තොරතුරු නිකුත් කිරීමෙන්, මහජන පැමිණිලි භාර ගෙන පරීක්ෂණ පැවැත්වීමෙන් සහ අවස්ථානුකූලව පරීක්ෂණ ගාස්තු ලෙස වූදිත මිනින්දෝරුවරුන්ගෙන් අයකරන පරීක්ෂණ ගාස්තු ආදියෙන්ද මැනුම් සභාවට අරමුදල් එක් රැස් වේ.

2022 වසරේ දෙසැම්බර් මස 31 වන දිනට මැනුම් සභාවේ ස්ථාවර තැන්පතු ගිණුමේ තිබූ අරමුදල් ශේෂය රු.17,940,464.00 ක් විය.

10.3 සභාවේ මූල්‍ය විගණන කටයුතු

10.3.1 අභ්‍යන්තර විගණන කළමනාකරණ රැස්වීම්

මැනුම් සභාව විසින් කරනු ලබන මූල්‍ය කටයුතු විගණකාධිපති විසින් වාර්ෂික විගණනයට භාජනය කරනු ලැබේ. විගණන කළමනාකරණ කමිටුවක්ද මැනුම් සභාව විසින් පත් කර ඇති අතර එහි සංයුතිය පහත සඳහන් සාමාජිකයින්ගෙන් හා සභාවේ නිළධාරීන්ගෙන් සමන්විත වේ.

i. මුදල් අමාත්‍යාංශ නියෝජිත (සභාපති)
ii. මැනුම් සභාවේ සාමාජිකයින් දෙදෙනෙකු (සාමාජික)
iii. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු (නිරීක්ෂක
iv. ඉඩම් අමාත්‍යාංශයෙහි නියෝජිතයෙකු (සාමාජික)
v. මැනුම් සභාවේ ගණකාධිකාරී
vi. මැනුම් සභාවේ ලේකම්

සාමාන්‍යයෙන් මෙම කමිටුව ත්‍රෛමාසිකව රැස් වන අතර එහිදී, සභාවේ කටයුතු විශ්ලේෂණාත්මකව විමසා බලනු ලැබීමෙන් පසු එකී කමිටු වාර්තා මැනුම් සභාවේ අවධානයට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කෙරේ. කෙසේ වුවද 2022 වර්ෂය තුලදී වරින්වර රටේ ඇතිවූ ගැටළුකාරී තත්වය හමුවේ සමාලෝචිත කාල සීමාව තුලදී අභ්‍යන්තර විගණන කළමනාකරණ රැස්වීම් 03 ක් පමණක් පවත්වා ඇත.

එම රැස්වීම් සඳහා සමාජිකයින් හා සභාවේ නිළධාරි සහභාගිවීම් පහත පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	සහභාගි වූ රැස්වීම් ගණන
1	එච්.එම්.එස්.ධර්මවර්ධන	සභාපති	03
2	එන්.ඒ.ගුණවර්ධන	සමාජික	03
3	කේ.කේ.එස්.රත්නායක	සමාජික	01
4	ඩබ්.එම්.රමාා ලාලනී	නිරීක්ෂක	03
5	ඒ.කේ.ඩී.අනුරුද්ධිකා	සමාජික	02
6	කේ.එල්.ඒ.එන්.සඳමාලි	ගණකාධිකාරී / අර්ධ කාලීන	03
7	එම්.එන්.අමරසිරි	ලේකම් / වැඩ බලන	03

2022 වසර සඳහා නිකුත් කරන ලද විගණකාධිපතිගේ විගණන වාර්තාව මෙහි අඩංගු කොට ඇත.

එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය
ඉඩම් හා මැනුම් මණ්ඩලය

එස් සිවානන්දරාජා
සභාපති
ඉඩම් මැනුම් සභාව

Chairman
Land Survey Council

11. 2022 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශනය (ඇමුණුම්)

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2022 දෙසැම්බර් 31 වන දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු

	සටහන්	2022	2021
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	1	76,096,858	75,730,165
		76,096,858	75,730,165
ජංගම වත්කම්			
අවසන් තොගය ***31.12.2021***	2	383,348	313,750
ආපදා ණය	3	186,539	425,717
ස්ථාවර තැන්පතු	4	17,940,464	12,850,945
ලැබිය යුතු දෑ	5	627,169	94,320
මුදල් හා මුදල් සමාන දෑ		879,290	4,129,981
		20,016,809	17,814,712
මුළු වත්කම්		96,113,667	93,544,878
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධන දායකත්වය දරනුයේ:			
මහා භාණ්ඩාගාරය		1,043,030	1,043,030
සම්මුඛවිත අරමුදල		84,833,596	83,888,311
අතිරික්තය/ (ඌනතාවය)		367,510	958,915
		85,201,106	84,847,226
මුළු හිමිකම්		86,244,136	85,890,256
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්	6	752,040	813,471
ජංගම වගකීම්			
උපචිත වියදම්	7	589,329	516,234
පූර්ව ලැබීම්- මිනින්දෝරු දිනය සඳහා රැස්කළ මුදල්		-	855,765
පූර්ව ලැබීම් ආදායම්	8	8,528,162	5,469,152
		9,117,491	6,841,151
මුළු වගකීම්		9,869,531	7,654,622
මුළු හිමිකම් හා වගකීම්		96,113,667	93,544,878

ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් වගකියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරවු කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.

එච්.එම්.බී.පී.හේරත්	එස් සිවානන්දරාජා	කේ එල් ඒ එම් සඳමාලි
ලේකම්	සභාපති	ගණකාධිකාරී
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	ඉඩම් මැනුම් සභාව	ඉඩම් මැනුම් සභාව

එච්.එම්.බී.පී. හේරත්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහාලේඛණ කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

Chairman
Land Survey Council

Accountant
Land Survey Council

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

රු.

	සටහන්	2022	2021
ආදායම්			
බලපත්‍ර ගාස්තු		3,108,900	4,520,310
ලියාපදිංචි කිරීමේ ගාස්තු		280,000	466,500
ස්ථාවර තැන්පතු පොළිය	9	1,562,631	671,759
වෙනත් ආදායම්	10	829,377	839,508
වැඩමුළුවලින් ලත් ශුද්ධ ආදායම	11	1,697,800	
මුළු ආදායම		7,478,708	6,498,077
අඩු කළා: වියදම්			
පරිපාලන හා ආයතනික			
සේවක පාරිශ්‍රමික	12	2,841,015	2,442,480
අනෙකුත් දීමනා	13	1,682,370	1,638,833
ගමන් වියදම්	14	364,654	175,784
ලිපිද්‍රව්‍ය	2	151,402	132,451
රැස්වීම් සඳහා සංග්‍රහ වියදම්		159,945	82,880
පිරියත යන්ත්‍රෝපකරණ හාඋපකරණ වැඩිදියුණු කිරීම		8,950	6,500
පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව	15	144,797	41,845
ටෙලිකොම්/ තැපැල් හා සන්නිවේදන කටයුතු		113,681	139,459
විදුලි වියදම්		74,534	74,534
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6	53,112	55,795
ජල බිල්පත්		4,200	4,200
විගණන ගාස්තු		144,000	144,000
අනෙකුත් වියදම්	16	1,080,611	458,030
		6,823,271	5,396,792
මූල්‍ය හා වෙනත් වියදම්			
බැංකු ගාස්තු		20,330	7,000
ක්ෂය කිරීම්	1	267,597	135,370
		287,927	142,370
මුළු වියදම්		7,111,198	5,539,162
අතිරික්තය/ (ඌනතාවය)		367,510	958,915

සභාපති
ඉඩම් මැනුම් සභාව

Chairman
Land Survey Council

උප සභාපති
ඉඩම් මැනුම් සභාව

Vice Chairman
Land Survey Council

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

LKR.

	Notes	2022	2021
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
අතිරික්කය/ (ඌනතාවය)		367,510	958,915
ගැලපුම් කළා			
ක්ෂය කිරීම්	1	267,597	135,370
ස්ථාවර වත්කම් අපහරණය කිරීමේ පාඩුව			
පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්	6	53,112	55,795
සමුච්චිත අරමුදල සඳහා පූර්ව වර්ෂ ගැලපුම්	17	(13,630)	98,524
ස්ථාවර තැන්පතු පොළිය		(1,562,631)	(671,759)
කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		(888,042)	576,845
කාරක ප්‍රාග්ධන වෙනස් වීම්			
තොගය (වැඩිවීම්)/(අඩුවීම්)	2	(69,598)	(313,750)
ආපදා ණය (වැඩිවීම්)/(අඩු වීම)	3	239,178	159,984
ලැබිය යුතු දෑ (වැඩිවීම්)/(අඩු වීම)	5	(532,849)	45,980
ගෙවිය යුතු මුදල් (වැඩිවීම්)/(අඩු වීම)	7	73,095	(59,290)
අත්තිකාරම් (වැඩිවීම්)/(අඩු වීම)		(855,765)	(2,400)
ආදායම්වල පූර්ව ලැබීම් (වැඩිවීම්)/(අඩු වීම)	8	3,059,010	329,452
මෙහෙයුම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		1,025,029	736,822
පාරිතෝෂික ගෙවීම්		(114,542)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		910,487	
ආයෝජන ක්‍රියාකාරකම්			
ස්ථාවර තැන්පතු	4	(5,089,519)	(1,698,136)
ස්ථාවර වත්කම් මිලදී ගැනුම්	1	(634,290)	(159,574)
ස්ථාවර වත්කම් අපහරණය කිරීම් විකිණීමෙන් ලද ආදායම්			
ලැබූ පොලී ආදායම	9	1,562,631	671,759
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(4,161,178)	(1,185,951)
මූල්‍ය ක්‍රියාකාරකම්			
මුදල් හා මුදල් සමාන දෑහි ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)		(3,250,691)	(449,129)
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		4,129,981	4,579,110
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		879,290	4,129,981

සභාපති
ඉඩම් මැනුම් සභාව

Chairman
Land Survey Council

උප සභාපති
ඉඩම් මැනුම් සභාව

Vice Chairman
Land Survey Council

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

රු.

විස්තරය	සටහන්	ප්‍රාග්ධන ප්‍රදාන	සමුච්චිත අතිරික්තය/(හිඟය)	එකතුව
2022 ජනවාරි මස 01 දිනට ශේෂය		**1,043,030**	**84,847,226**	**85,890,256**
				-
සමුච්චිත අරමුදලට පෙර වර්ෂයේ ගැලපීම්	**17**	-	**(13,630)**	**(13,630)**
එකතු කළා/(අඩු කළා)			**367,510**	**367,510**
2022 දෙසැම්බර් 31 වන දිනට ශේෂය		**1,043,030**	**85,201,106**	**86,244,136**

සභාපති
ඉඩම් මැනුම් සභාව

Chairman
Land Survey Council

උප සභාපති
ඉඩම් මැනුම් සභාව

Vice Chairman
Land Survey Council

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 වසර

රුපියල්

සටහන 1:	දේපළ, පිරියක හා උපකරණ					
අයිතමය	2022.01.01	වර්ෂය තුළ එකතු කිරීම්/අඩු කිරීම්	අඩුකිරීම්	ක්ෂය කිරීම් %	වාර්ෂික ක්ෂය කිරීම්	2022.12.31 දිනට ඉද්ධ අගය
ඉඩම්	75,100,000.00					75,100,000.00
යන්ත්‍රෝපකරණ	159,628.47			20%	31,925.69	127,702.78
ගෘහභාණ්ඩ	202,011.89			10%	20,201.19	181,810.70
පරිගණක සහ උපාංග	103,690.04	630,000.00		25%	183,422.51	550,267.53
කාර්යාලීය උපකරණ	784.32	4,290.00		25%	1,268.58	3,805.74
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව	10,350.00			20%	2,070.00	8,280.00
ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම්)	133,393.11			20%	26,678.62	106,714.49
අස්පෘශ්‍ය වත්කම්					-	-
ගිණුම්කරණ මෘදුකාංග	20,307.36			10%	2,030.74	18,276.62
		-				
එකතුව	**75,730,165.19**	**634,290.00**	**-**		**267,597.33**	**76,096,857.86**

සටහන 2	**2022.12.31 දිනට තොගය**		
	ආරම්භක තොගයේ ශේෂය	**313,749.96**	
	වසර තුල මිලදී ගැනීම්	220,999.23	
	ලිපිදුව්‍ය වියදම්	(151,401.60)	
	අවසාන තොගය		**383,347.59**

සටහන 3	ආපදා ණය		
ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී		107,345.00	
ටී.ජී.ප්‍රනාන්දු		79,194.00	
එකතුව			**186,539.00**

සටහන 4	ස්ථාවර තැන්පතු				
ස්ථාවර තැන්පතු අංකය	ආරම්භ කළ දිනය	කාල සීමාව	වටිනාකම	.	
82652551	2018.05.10	1 YEAR	1,388,106.27		
82652638	2018.05.10	1 YEAR	1,388,106.27		
82652648	2018.05.10	6 MONTHS	1,454,625.57		
82652661	2019.05.10	6 MONTHS	1,454,625.57		
85143581	2019.11.19	6 MONTHS	400,000.00		
85143616	2019.11.19	6 MONTHS	400,000.00		
85143810	2019.11.19	6 MONTHS	400,000.00		
85144124	2019.11.19	6 MONTHS	400,000.00		
85144216	2019.11.19	6 MONTHS	400,000.00		
85144265	2019.11.19	6 MONTHS	400,000.00		
85144298	2019.11.19	6 MONTHS	400,000.00		
85144323	2019.11.19	6 MONTHS	400,000.00		
86795372	2020.12.17	1 YEAR	1,000,000.00		
88130317	2021.11.23	1 YEAR	1,055,000.00		
87153136	2021.02.22	1 YEAR	1,000,000.00		
88345281	2022.01.07	1 YEAR	1,000,000.00		
89850843	2022.11.11	200 DAYS	1,000,000.00		
89850793	2022.11.11	200 DAYS	1,000,000.00		
89850725	2022.11.11	200 DAYS	1,000,000.00		
90008749	2022.12.14	1 YEAR	1,000,000.00		
90008689	2022.12.14	1 YEAR	1,000,000.00		
				17,940,463.68	
එකතුව					**17,940,463.68**

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 වසර

රුපියල්

සටහන 5	ලැබිය යුතු ආදායම්		
ලැ/යූ ස්ථාවර කැමපත් පොළී		634,046.00	
ලැ/යූ පැමිණිලි ගාස්තු		74,800.00	
එකතුව			708,846.00

සටහන 6:	පාරිතෝෂික ප්‍රතිපාදන			
නම	ආරම්භක වර්ෂය	2021වසර දක්වා	2022	එකතුව
ඩබ්.ඒ.එස් ප්‍රියදර්ශනී	2004	390,150.00	34,830.00	424,980.00
ආර් .එම්.එන් රත්නායක	2013	114,542.00	(114,542.00)	-
ටී.ජී ප්‍රනාන්දු	2004	308,778.50	18,281.50	327,060.00
එකතුව		813,470.50	(61,430.50)	752,040.00

සටහන 7:	උපචිත වියදම්		
උපචිත විගණන ගාස්තු		432,000.00	
උපචිත විගණන විදුලි සංදේශ හා කැපැල් ගාස්තු		3,531.24	
උපචිත අර්ථසාධක දායකත්ව මුදල්		20,533.33	
උපචිත සේවා නියුක්ති දායක මුදල්		3,080.00	
Q B		13,966.90	
උපචිත ගැසට් මුද්‍රණ ගාස්තු		56,637.50	
උපචිත වායු සම්කරන ගාස්තු		58,650.00	
උපචිත මුද්දර ගාස්තු		930.00	
එකතුව			589,328.97

සටහන 8:	පූර්ව ආදායම් ලැබීම්		
අඛණ්ඩ ව්‍යක්තිය සංවර්ධන කටයුතු වෙනුවෙන් පූර්ව අක්කිකාරම්		556,750.00	
වෙනත්		501,500.00	
බලපත්‍ර ගාස්තු වශයෙන් පූර්ව ලැබීම්		7,395,111.99	
ලැබිය යුතු		74,800.00	
එකතුව			8,528,161.99

සටහන 9:	ස්ථාවර කැන්පතු පොළිය	
ස්ථාවර කැන්පතු අංකය	පොළිය	ලැබිය යුතු පොළී
85143581	40,479.45	6,502.69
85143616	40,479.45	6,502.69
85143810	40,479.45	6,502.69
85144124	40,479.45	6,502.69
85144216	40,479.45	6,502.69
85144323	40,479.45	6,502.69
85144357	17,135.39	
85144467	10,307.25	
85537997	10,839.70	
86795372	55,301.37	4,193.55
87329641	17,324.73	
87805454 SURVEY DAY	55,423.28	
83986770	12,465.75	
85144265	40,479.45	6,502.69
85144298	40,479.45	6,502.69
87153136	50,000.00	46,815.48
82652551	66,100.30	106,122.96
82652638	66,100.30	106,122.96
82652648	135,214.26	26,531.28
82652661	135,214.26	26,531.28
88130317	55,000.00	13,612.90
88345281		54,112.90
89850843		30,846.77
89850793		30,846.77
89850725		30,846.77
90008749		11,881.72
90008689		11,881.72
එකතුව	1,010,262.19	552,368.58
		1,562,630.77

ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2022 වසර

රුපියල්

සටහන 10:	**ක්‍රියාකාරිත්වයෙන් ලැබීම්**		
ප්‍රකාශන ආදායම		19,500.00	
විමර්ශන ලියාපදිංචි කිරීමේ ආදායම		88,500.00	
පරීක්ෂණ සඳහා දඩ මුදල්		177,500.00	
බලපත්‍ර ගාස්තු ප්‍රමාද වීම සඳහා ලැබූ ආදායම		243,350.00	
ආපදා ණය පොළිය		10,921.86	
වෙනත් ආදායම		220,457.99	
වැටුප් රහිත නිවාඩු අයකිරීම් ආදායම		44,333.33	
සේවා ගාස්තු ආදායම		200.00	
මහජනයා වෙත තොරතුරු නිකුත් කිරීම		24,614.00	
එකතුව			**829,377.18**
සටහන 11:	**වැඩමුළු වලින් ලද ආදායම**		
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් 09		122,500.00	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් 10		260,000.00	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 12		405,000.00	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් 13		365,000.00	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 14		415,000.00	
SISL ආයතනය මඟින් පැවැත් වූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ආදායම		102,950.00	
හාඟිර ආයතන මඟින් පැවැත්වූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ආදායම		27,350.00	
එකතුව			**1,697,800.00**
සටහන 12:	**පුද්ගල වැටුප් හා චෙතන**		
මූලික වැටුප්		1,052,840.00	
ජීවන වියදම් දීමනාව		202,800.00	
පුහුණුලාභීන්ගේ දීමනාව		944,333.34	
සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% දායකත්වය		279,208.31	
සේවක අර්ථසාධක අරමුදල සඳහා 3% දායකත්වය		69,802.08	
හිඟ දීමනා		15,000.00	
වෙනත් දීමනා		262,333.33	
හිඟ වැටුප්		14,698.05	
එකතුව			**2,841,015.11**

				රුපියල්
සටහන 13:	**වෙනත් දීමනා**			
සභාපති සඳහා දීමනාව			450,000.00	
උප සභාපති සඳහා දීමනාව			360,000.00	
ලේකම් සඳහා දීමනාව			159,525.00	
ගණකාධිකාරි සඳහා දීමනාව			142,845.00	
විගණන හා කළමනාකරණ කමිටු දීමනාව			60,000.00	
සභාවේ දීමනාව			510,000.00	
එකතුව				**1,682,370.00**
සටහන 14:	**ගමන් වියදම්**			
ඉඩම් මැනුම් සභාවේ රැස්වීම්			296,704.40	
රට තුළ ගමන් වියදම්			67,949.85	
එකතුව				364,654.25
සටහන 15:	**පිරියක යන්ත්‍රෝපකරණ උපකරණ නඩත්තු කිරීම**			
වායුසමීකරණ යන්ත්‍ර ප්‍රතිසංස්කරණය			108,085.05	
ගිණුම් මෘදුකාංග			23,711.90	
වෙබ්අඩවිය			13,000.00	
එකතුව				**144,796.95**
සටහන් 16:	**වෙනත් වියදම්**			
දැන්වීම් - ගැසට් නිවේදන			609,704.61	
භාෂා පරිවර්තන ගාස්තු			94,230.50	
සහතිකපත්‍ර මුද්‍රණය			21,418.75	
පාරිතෝෂික වියදම්			6,698.00	
ගැසට් මුද්‍රණය			56,637.50	
ස්මාර්ට් බලපත්‍ර මුද්‍රණය			72,700.00	
ලේකම් තනතුර සඳහා වූ සම්මුඛ පරීක්ෂණය			53,115.00	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන සඳහා වියදම්			70,276.88	
නීති ගාස්තු			92,500.00	
විවිධ වියදම්			3,330.00	
එකතුව				**1,080,611.24**
සටහන් 17:	**සමුච්චිත අරමුදලට පෙර වසර ගැලපීම්**			
01.01.2022 දිනට ශේෂය			**84,847,226**	
මුද්දර ගාස්තු	ලි.ප.අංකය 20001059	380.00		
ප්‍රමාද බලපත්‍ර ගාස්තුව	ලි.ප.අංකය 20071660	10,000.00		
ප්‍රමාද බලපත්‍ර ගාස්තුව	ලි.ප.අංකය19911357	500.00		
ප්‍රමාද බලපත්‍ර ගාස්තුව	ලි.ප.අංකය 19971400	2,750.00	**13,630**	
ගැලපීම් පසු ශේෂය			**84,833,596**	

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1. පිළියෙල කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති හා 1971 අංක 38 දරන මූදල් පනතේ විධිවිධාන වලට අනුකූලව පිළියෙල කර ඇත.

1.2. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම් අනුව පිළියෙල කර ඇත.

1.3. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පය මත පිළියෙල කර ඇත.

2. දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීමේ පදනම

ඉඩම් - ඉඩම් සාධාරණ අගය මත සටහන් කර ඇත.

අනෙකුත් වත්කම් - ඓතිහාසික පිරිවැය යටතේ හඳුනාගැනේ.

2.1.දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීමෙන් පසු නැවත අයකර ගත හැකි අගයට ගිණුම් ගත කරනු ලැබේ

2.2. ක්ෂය කිරීම

ඕනවෙන ඝේෂ ක්‍රමයට පහත අනුපාතික යටතේ ඉකුත් වර්ෂය හා අනුකූලව ක්ෂය කිරීම් දක්වා ඇත.

වත්කම් වර්ගය	%
යන්ත්‍රෝපකරණ	20
ගෘහභාණ්ඩ	10
පරිගණක හා උපාංග	25
කාර්යාලීය උපකරණ	25
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරුව	20
ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම්)	20
ගිණුම්කරණ මෘදුකාංග	10

3. බැංකුවල ඇති කැන්පතු හා බැංකුවේ ඇති මුදල්

බැංකු වල ඇති කැන්පතු සම්පූර්ණ වශයෙන්ම සමන්විත වනුයේ ලංකා බැංකුවේ පවත්වාගෙන යන ස්ථාවර කැම්පතු වශයෙනි.


4. පොලී ආදායම හඳුනා ගැනීම

උපචිත පදනම් මත පොලී ආදායම් හඳුනාගනු ලබන අතර ලැබිය යුතු පොලිය පොලී අදායම් තුල ඇතුලත් වේ.

தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	ඒආර්අයි/එෆ්/එල්එස්සී/1/22/14	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி Date

2022 මැයි 31 දින



සභාපති
ඉඩම් මැනුම් සභාව

ඉඩම් මැනුම් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් මැනුම් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 2002 අංක 17 දරන මැනුම් පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි අවසාන තොගයෙහි වටිනාකම රු.383,348 ක් ලෙස සටහන් වුවද, අවසාන තොග ගණනය කිරීමේ වාර්තාව පරීදි එහි වටිනාකම රු. 294,263 ක් වූ හෙයින් රු. 89,085 කින් තොග අධිගණනය වී තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 27 වන ඡේදය ප්‍රකාරව ගිණුම් ප්‍රතිපත්තියක වෙනස්වීම අතීතානුයෝගීව ව්‍යවහාර කළවිට එම අලුත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය පෙර සිට ව්‍යවහාර කළාසේ සලකා අස්තිත්වය ඉදිරිපත් කරනු ලබන පැරණිම පෙර කාලපරිච්ඡේදය සහ ඉදිරිපත් කරනු ලබන අනෙක් සියලුම පෙර කාලපරිච්ඡේද සඳහා ශුද්ධ වත්කම්වල/ස්කන්ධයේ ඇති බලපෑමට යටත්වන සෑම සංරචකයකම ආරම්භක ශේෂය ගැලපිය යුතුය. ඒ අනුව පසුගිය වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ගණනය මුදල් පදනමටද සමාලෝචිත වර්ෂයේදී එම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කර උපචිත පදනම යොදාගැනීම නිසා සමුච්චිත අරමුදලෙහි ආරම්භක ශේෂයට එකතු කළයුතු රු.153,581 ක් මෙම වර්ෂය තුළදී ලද ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.153,581 කින් අධිතක්සේරු වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 34 වන ඡේදය ප්‍රකාරව ස්ථාවර තැන්පතු පොලිය මුදල් පදනමේ සිට උපචිත පදනමට වෙනස් කිරීමේ ප්‍රතිපත්ති වෙනස්වීමට අදාළව සිදුකළ යුතු පහත හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශය තුළ සිදුකොට නොතිබුණි.

- ප්‍රවර්ථන කාලපරිච්ඡේදය සහ ඉදිරිපත් කර ඇති එක් එක් පෙර කාලපරිච්ඡේදය සඳහා ප්‍රායෝගික වනතාක් දුරට බලපෑමක් ඇති වූ එක් එක් මූල්‍ය ප්‍රකාශන රේඛීය අයිතම සඳහා වන බලපෑම
- ප්‍රායෝගික වනතාක් දුරට ප්‍රවර්ථන කාලපරිච්ඡේදය සහ ඉදිරිපත් කර ඇති සෑම පූර්ව කාලපරිච්ඡේදයක් සඳහා වන ගැලපුම් අගය

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ලැබිය යුතු ආදායම් ශේෂය රු. 627,169 ක් වුවද, ඊට අදාළ අංක 05 දරන විස්තරාත්මක සටහනෙහි රු. 708,846 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 81,677 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) 2022 පෙබරවාරි මස විශ්‍රාම ගිය නිලධාරිනියකට පාරිතෝෂික මුදල ලෙස රු.121,240 ක් 2022 මාර්තු 24 දින ගෙවා අදාළ පාරිතෝෂික වෙන්කිරීමෙන් ගිණුමේ ඒ සඳහා රු.114,542 ක් පමණක් අඩුකිරීම කර තිබුණි. ඒ අනුව වෙනස රු.6,698ක් විය.තවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහිද පාරිතෝෂික ගෙවීම් ලෙස රු.114,542 ක් පමණක් දක්වා තිබුණි.

(ඊ) පසුගිය වර්ෂයේ බලපත්‍ර ඉල්ලුම් කළ අයදුම්කරුවන්ට බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන් පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනයෙන් ඉදිරියට ගෙන එන ලද බලපත්‍ර ආදායම රු.5,111,652 ක් වූ අතර සමාලෝචිත වර්ෂයෙන් ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම රු.7,469,912 ක් විය.මෙම ශේෂ අතර රු.1,879,710 ක් වර්ෂ දෙකේදීම නොවෙනස්ව පැවති අතර ඉන් රු.1,356,600 ක් සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර

ලබාගැනීමට අයදුම් කරුවන් 357 දෙනෙකු විසින් පසුගිය වර්ෂයේදී ගෙවන ලද ගාස්තු වන අතර ඔවුන්ට සමාලෝචිත වර්ෂයේදීද බලපත්‍ර නිකුත්කොට නොතිබුණි.ඒසේම ඉතිරි ශේෂය වූ රු.523,110 කුමක් සඳහා වූ ලැබීමක් ද යන්න නිශ්චිතවම හඳුනාගෙන නොතිබුණි.

(උ) ආදායම් ලෙජර ගිණුම තුළ, ඉදිරියට ලද බලපත්‍ර ආදායම රු.7,469,912ක් වූවද, මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 08 යටතේ එම ආදායම රු.7,395,112ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 74,800 නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද රු. 186,150 ක හඳුනා නොගත් ලැබීම් ශේෂයක් නිශ්චිතව හඳුනාගෙන නොතිබියදී සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට බැර කර තිබුණි.

(එ) මැනුම් පනතෙහි 47 (3) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරුවරයකු වෘත්තීය විෂමාචාරයට වරදකරු වී ඇතිවිට, ඔහු විසින් සභාවට ගෙවිය යුතු සියලු ගාස්තු හා වියදම් සභාවට අයවිය යුතු ණයක් වශයෙන් අයකරනු ලැබියයුතු වුවද, ලියාපදිංචිය අවලංගු කරන ලද අංක 19891607 දරන මිනින්දෝරුවරයාගේ නම ගැසට්පත්‍රයේ පළකිරීම වෙනුවෙන් සභාව විසින් වියදම් කරන ලද රු.5,908 ක මුදල අදාළ මිනින්දෝරුවරයාගෙන් අයකරගෙන නොතිබුණ අතර එය ණයගැති ශේෂයක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන්ද හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 හි 36 වන වගන්තිය ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කළ යුතු වුවද, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරයෙකුගේ බලපත්‍රය අවලංගු කිරීමට එරෙහිව එම මිනින්දෝරුවරයා විසින් අභියාචනාධිකරණය වෙත ගොනුකර තිබෙන අංක CA/MISC/04/16 දරන නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සභාවේ 2022 කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ 1.2 කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලේඛ ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය	තුන්වන උපලේඛනයේ සඳහන් ආයතන පමණක් බදු ගෙවීමෙන් නිදහස් කර ඇතත්, සභාව එහි සඳහන් ආයතනයක් නොවන බැවින් ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23 (1) (අ) වගන්තිය	තොරතුරු නිලධාරියකු පත් කර නොතිබුණි.
(ඇ)	භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොත (i). 6.6 ඡේදය	මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපතිට ද පිටපත්, සහිතව රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් සභාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2023 අප්‍රේල්

25 දිනදීය.

සභාවේ වාර්ෂික වාර්තාව භාෂා තුනෙන්ම මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් මාස 05 ක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2015,2016,2017,2018,2019,2020 සහ 2021 වර්ෂවලට අයත් වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය

(i). 2.3 ඡේදය — සමාලෝචිත වර්ෂය සඳහා උපායමාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්මද පිළියෙල කර නොතිබුණි.

(ii). 4.2 (h) ඡේදය — සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ රැස්වීම් කාර්තුවකට එක බැගින් 04ක් පැවැත්විය යුතු වුවත් රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන් 2002 ඔක්තෝම්බර් 04 දිනැති 2002 අංක 17 දරන මැනුම් පනත	නිරීක්ෂණ
(අ) 32(1) වගන්තිය	2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාවට ලේකම්වරයෙකු පත් කරගෙන නොතිබුණි.
(ආ) 37(උ) වගන්තිය	ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව, පිළිගැනීම යන කරුණුවලදී සම තත්ත්වයක් සහ අන්‍යොන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යොන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම ක්‍රියාත්මක කිරීම සභාවේ කර්තව්‍යයක් වුවද එය සිදුකර නොතිබුණි.
(ඇ) 38 (ඇ) වගන්තිය	සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම සිදුකළ යුතු වුවද, සමාලෝචිත

වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එහි ස්ථිර කාර්ය මණ්ඩලය එක් කලමනාකරණ සේවා නිලධාරිනියක හා එක් කාර්යාල සහායකවරයෙකුට සීමා වී තිබුණු අතර තාවකාලිකව කොන්ත්‍රාත් පදනම මත නිලධාරිනියන් තිදෙනෙකු සේවය කරන බවට නිරීක්ෂණය විය. ගිණුම්කරණ කටයුතු සහ මහජන සම්බන්ධතා පවත්වා ගැනීමේ කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගත යුතු බවට 2019 ජනවාරි 03 දිනැති 239 වැනි සභා රැස්වීමේදී තීරණය කර තිබුණු අතර 2020 සැප්තැම්බර් 03 දින කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කලමනාකරණ සහකාර තනතුරු 02ක් අනුමත කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම එම තනතුර සඳහා බඳවාගැනීමේ පටිපාටිය අනුමත කරවාගෙන නොතිබුණි.

(ඇ) 38 (උ) වගන්තිය

සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සකස්කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ඉ) 46 වගන්තිය

සභාව වෙත ඉදිරිපත් කෙරෙන මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි විභාග කිරීම කළ යුතු වුවද 2020 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 113 න් 80 ක් ද, පසුගිය වර්ෂයේදී ලැබුණු පැමිණිලි 143 න් 104 ක් ද, සමාලෝචිත වර්ෂයේදී ලැබුණු පැමිණිලි 176 න් 134 ක් විසඳා නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සභාවේ ප්‍රධානතම කාර්යයක්වන ඉඩම් මැනුම් සභාව වෙත ඉදිරිපත්කරනු ලබන පැමිණිලි විභාග කිරීම සඳහා සෑම මසකට වරක්ම සභාව රැස්වන අතර, එක් සභා වාරයකදී විභාග කිරීමට ගන්නා පැමිණිලි සංඛ්‍යාව 4 සිට 10 දක්වා පරාසයක පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී සභාවේ වැටුප් හා දීමනා එකතුව සමස්ත වියදමෙන් සියයට 63 ක් විය. එහෙත් ලැබුණු පැමිණිලි 176 න් විභාගකර ඇත්තේ 42ක් එනම්, සියයට 24 ක් පමණි.

ඩබ්ලිව්.පී.ඒ.වික්‍රමරත්න

විගණකාධිපති